**ශීර්ෂය - 8 ජාතික පොලිස් කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳ ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 20 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.5 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1) (අ) | නිවැරදි සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | අධි ප්‍රතිපාදනය | 2.3 |
| 127 (1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීම.<br>2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.4<br>2.5 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.<br>2. ආයතනික හා විනය පාලනයේ කාර්යසාධනයේ අඩුපාඩු | 2.1.4<br>2.1.3 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වන ආකාරයක් සලසා තිබීම. | 1. මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රමාදයන්<br>2. භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබීම. | 2.1.1<br>2.2 |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් නොකිරීම. | 2.1.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

### 2.1 කාර්යසාධනය

---------------

#### 2.1.1 මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------------------

2015 ඔක්තෝබර් මස සිදුකරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලබා දී තිබූ බලතල අතර මහජනතාවට සිදුවන අසාධාරණයන්ගෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා මහජනතාවගෙන් ඉදිරිපත් වන පැමිණිලි විමර්ශනය කොමිෂමේ ප්‍රධාන කාර්යයක් විය. මෙම කාර්යය ඉටු කරගැනීම සඳහා කොමිෂන් සභාවේ වෙනම මහජන පැමිණිලි විමර්ශන අංශයක් ස්ථාපිත කර තිබුණි. එම අංශය මගින් 2016 හා 2017 වර්ෂවලදී සිදු කරන ලද විමර්ශන කටයුතු පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

| | 2016 | | 2017 | | |
|---|---|---|---|---|---|
| පැමිණිල්ලේ ස්වභාවය | ලද පැමිණිලි සංඛ්‍යාව | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | ලද පැමිණිලි සංඛ්‍යාව | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය |
| පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 737 | පැමිණිල්ලේ ස්වාභාවය අනුව වර්ගීකරණයන් සිදුකර නොතිබුණි. | 480 | 249 | 52 |
| පහරදීම | 46 | | 33 | 13 | 39 |
| වධහිංසා පැමිණවීම | 18 | | 04 | - | - |
| බලය අයථා ලෙස පරිහරණය | 486 | | 377 | 220 | 58 |
| කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 09 | | 08 | 03 | 38 |
| නීති විරෝධි ලෙස රඳවා ගැනීම | 51 | | 45 | 37 | 82 |

| | | | | | |
|---|---|---|---|---|---|
| අල්ලස් දූෂණ | 10 | | 13 | 01 | 7 |
| පක්ෂග්‍රාහී වීම | 257 | | 256 | 112 | 44 |
| බොරු චෝදනා කිරීම | 112 | | 91 | 42 | 46 |
| පොලිස් අත්අඩංගුවේ සිටියදී මරණ සිදුවීම | 03 | | 03 | - | - |
| වෙනත් | 150 | | 156 | 79 | 51 |
| **එකතුව** | **1,879** | **971** | **1,466** | **756** | **51** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහජන පැමිණිලි අතරින් වැඩිම සංඛ්‍යාවක් වාර්තාවන පොලිසිය විසින් ක්‍රියා නොකිරීම හා බලය අයථා ලෙස පරිහරණය සම්බන්ධ පැමිණිලි විය. එම පැමිණිලි සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණි. එසේ වුවද, පක්ෂග්‍රාහීවීම් සම්බන්ධයෙන් වූ මහජන පැමිණිලි පෙර වර්ෂය හා සම තත්වයේ සංඛ්‍යාවක්ම පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ලද 1466 ක මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලි 416 ක් බස්නාහිර කාර්යාලය වෙත ලැබී තිබූ අතර ඉන් පැමිණිලි 119 ක් පමණක් විසදා තිබුණි. පැමිණිලි විසදීමේ ප්‍රතිශතය සියයට 28 ක් තරම් පහළ මට්ටමක පැවතුණි.

### 2.1.2 නොවිසඳුණු විනය හා සේවය හැරයාම් අභියාචනා

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නොවිසඳුනු විනය හා සේවය හැරයාම් අභියාචනා 1766 ක් වූ අතර ඉන් අභියාචනා 346 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයකට පෙර සිට නොවිසඳී තිබුණි. අභියාචනා සම්බන්ධ කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| අභියාචනා වර්ගය | වර්ෂ 1 ට අඩු සංඛ්‍යාව | වර්ෂ 1 – 2 | වර්ෂ 2 ට වැඩි සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| විනය | 621 | 75 | 133 | 829 |
| සේවය හැරයාම් | 613 | 144 | 213 | 970 |
| | 1234 | 219 | 346 | 1799 |

### 2.1.3 ආයතනික හා විනය පාලනය

ශ්‍රී ලංකා පොලීසියේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට හා සහායක කාර්ය මණ්ඩලයට අයත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි පිළිවෙලින් 06 ක් සහ 105 ක් සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට අදාල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි 01 ක් ද සහායක සේවා කාර්ය මණ්ඩලයට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි 09 ක් ද 2018 ජුනි 30 දින වන විටත් අනුමත කර නොතිබුණි.

.

**2.1.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 ඔක්තෝබර් 30 දින අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ මූල්‍යාධාර ලබමින් ක්‍රියාත්මක Catalytic Support to Peace building ව්‍යාපෘතියෙහි ගිවිසුම අනුව, මහජන අදහස් විමසීමේ සැසි 3 ක් පැවැත්වීමට සැලසුම් කලද සමාලෝචිත වර්ෂය අවසාන වන විට සැසි 1 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) යථෝක්ත ව්‍යාපෘතිය සඳහා 2017 දෙසැම්බර් 08 දින අමතර ප්‍රතිපාදන රු.1,100,000 ක් භාණ්ඩාගාරයෙන් ලබා ගෙන තිබූ අතර එයින් රු.143,526 ක් හෙවත් සියයට 13 ක් පමණක් වියදම් කර රු.956,474 ක් නැවත භාණ්ඩාගාර තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

**2.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය අදාළ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 ජුලි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2018 ජනවාරි 23 වන දින භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර තිබුණද සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

**2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුල කොමිෂන් සභාවට සළසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 40.0 | 39.7 | 0.3 | 0.8 |
| | මූලධන | 5.3 | 5.2 | 0.1 | 1.9 |
| | **එකතුව** | **45.3** | **44.9** | **0.4** | **0.9** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 43.9 | 42.3 | 1.6 | 3.6 |
| | මූලධන | 0.9 | 0.7 | 0.2 | 22.2 |
| | **එකතුව** | **44.8** | **43.0** | **1.8** | **4.0** |
| 2015 | පුනරාවර්තන | 45.7 | 40.4 | 5.3 | 11.6 |
| | මූලධන | 1.4 | 0.8 | 0.6 | 42.9 |
| | **එකතුව** | **47.1** | **41.2** | **5.9** | **12.5** |
| 2016 | පුනරාවර්තන | 85.8 | 82.6 | 3.2 | 3.7 |
| | මූලධන | 3.1 | 2.7 | 0.4 | 12.9 |
| | **එකතුව** | **88.9** | **85.3** | **3.6** | **4.0** |
| 2017 | පුනරාවර්තන | 97.2 | 94.7 | 2.5 | 2.6 |
| | මූලධන | 3.9 | 2.5 | 1.4 | 35.8 |
| | **එකතුව** | **101.1** | **97.2** | **3.9** | **3.9** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.230,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

## 2.4 **විගණන හා කළමනාකරණ කමිටුව**

**-----------------------------------**

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන් සංශෝධිත 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් විගණන හා කළමණාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 50.75 ක් වැයකර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 28 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 63 | 51 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 16 | 16 | - |
| | **එකතුව** | **113** | **99** | **14** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුණ අතර කොමිෂන් සභාවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය නිලධාරීන් හඳුනාගෙන එම පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාකර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව ස්ථිර පදනම මත 101 ක් සහ කොන්ත්‍රාත් පදනම මත 12 ක් ද වශයෙන් බඳවා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව තුල ස්ථිර පදනම මත 55 ක් ද කොන්ත්‍රාත් පදනම මත 44 ක් ද වශයෙන් බඳවා ගෙන තිබුණි. ඒ අනුව ස්ථිර පදනම මත බඳවා ගත යුතු සේවකයින් 32 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.